සැකපිට අත්අඩංගුවට ගෙන තවමත් රඳවා තබාගෙන සිටින හිජාස් හිස්බුල්ලා සම්බන්ධයෙන් විටින් විට තොරතුරු මාධ්‍ය වල පළ වන අතර, ඒ ඇතැම් පුවත් වාර්තාවන් තුළ හිජාස් හිස්බුල්ලා සම්බන්ධයෙන් අගතිගාමී තොරතුරුද පළවනු අපට දැකිය හැක. මව්බිම පුවත්පතේ (03/19) "පාස්කු ඉරිදා බෝම්බකරුවන් සමග සබඳතා පැවැත්වූ හිජාස් හිස්බුල්ලා සහ පුත්තලම මද්‍රසා විදුහල්පතිට එරෙහි නඩුව මැයි 19දා" යන සිරස්තලයෙන් යුතුව ඉදිරිපත් වූ පුවත් වාර්තාව ඊට උදාහරණයක් ලෙසින් දැක්විය හැක.

මෙහි පුවත් අන්තර්ගතයේ දැක්වෙන්නේ හිජාස් හිස්බුල්ලා සහ මද්‍රසා විදුහල්පති චෝදනා ලබා සිටින බවත්, ඔවුන්ට එරෙහිව පවරා ඇති නඩුව මැයි 19 දින කැඳවන ලෙස කොළඹ කොටුව මහේස්ත්‍රාත්වරයා නියෝග කළ බවත් පමණි. කෙසේ නමුත් පුවත් සිරස්තලයේ දැක්වෙන්නේ හිජාස් හිස්බුල්ලා සහ මද්‍රසා විදුහල්පති පාස්කු ඉරිදා බෝම්බකරුවන් සමඟ සබඳතා පැවැත්වූ බවයි. එසේ නම් තවමත් තීන්දුවක් ලැබී නොමැති, තවමත් විභාග වෙමින් පවත්නා නඩුවක සැකකරුවන්, වරදකරුවන් බවට මව්බිම පුවත්පත මගින් තීන්දු කර ඇත්තේ කුමන පදනමකින්ද? එය මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයක් නොවන්නේද?

#MediaEthicsSL #lka #SinhalaPress #Mawbima